එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 55(3)(එ) වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 57 වැනි වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදන ලද රීති.

**මහාචාර්ය එන්. ටී. සොහාන් විජේසේකර,**
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
(සඳහා හා වෙනුවෙන්)
සභාපති.

2020 ජුනි මස 19 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (තොරතුරු සඳහා උපදෙස් ලබාදීමට සහ තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලතල) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (මෙම නියෝගවල මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් -

(අ) අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් සඳහා අනුමැතිය බලාපොරොත්තු වන ව්‍යාපෘති ;

(ආ) දැනට සිදුකෙරීගෙන යන ව්‍යාපෘති ; සහ

(ඇ) නිම කරන ලද ව්‍යාපෘති,

පිළිබඳ තොරතුරු කාර්තුමය පදනමින් සැපයීමට පළාත් පාලන ආයතනයකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට නියම කරනු ලැබිය යුතු ය.

3. 2 වන රීතියේ සඳහන් එකී සෑම ඉදිකිරීම් ව්‍යාපෘතියක්ම පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ වර්ගීකරණය කරනු ලැබිය යුතු ය.

(අ) ගොඩනැගිලි ;

(ආ) ජල සම්පාදන සහ මළාපවහන ;

(ඇ) මහාමාර්ග ;

(ඈ) පාලම් ;

(ඉ) වාරිමාර්ග සහ ජලාපවහන කාණු පද්ධති ;

(ඊ) මඩ ඉසීම සහ ඉඩම් සකස් කිරීම ;

(උ) පිටාර ජලය බැහැර කිරීම සහ භූජල වහනය ;

(ඌ) සමුද්‍රීය ඉදිකිරීම් ; සහ

(එ) විශේෂිත ක්ෂේත්‍රයක බර ඉදිකිරීම්.

4. 3 වන රීතියේ සඳහන් එක් එක් ව්‍යාපෘති වර්ගය යටතේ ඇති එක් එක් ව්‍යාපෘති පිළිබඳ විස්තර, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් තිබිය යුතු අතර ඒවායෙහි -.

(අ) ව්‍යාපෘතියේ නම සහ ව්‍යාපෘතියේ පිහිටීම ;

(ආ) සේවාදයකයාගේ නම ;

(ඇ) ක්ෂේත්‍රය ;

(ඈ) ව්‍යාපෘති වර්ගය ;

(ඉ) ධාරිතාව හෝ ප්‍රමාණය ;

(ඊ) ව්‍යාපෘතියේ වටිනාකම ;

(උ) අරමුදල් සපයන ආයතනය හෝ නියෝජිත ආයතනය ;

(ඌ) සපයනු ලබන අරමුදලෙහි වටිනාකම ;

(එ) පාරිසරික අනුමැතීන් හි වලංගු කාල පරිච්ඡේදය ;

(ඒ) අවසර පත්‍රය හෝ බලපත්‍රය ප්‍රදානය කරන ලද දිනය ;

(ඔ) ආරම්භ කළ දිනය/ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය ; සහ

(ඕ) ව්‍යාපෘතිය නිමකළ දිනය හෝ නිමකිරීමට අපේක්ෂිත දිනය.

ඇතුළත් විය යුතු ය.

07 - 395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.